# ඩී.එස්. සේනානායක විදුහල, කොළඹ 07.


**දෙවන වාර පරීක්ෂණය - 2016**
**12 ශ්‍රේණිය**
**ආර්ථික විද්‍යාව - I**

*කාලය පැය 1*

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
**එක ප්‍රශ්නයට සඳහා ඇත්තේ එක් නිවැරදි පිළිතුරක් පමණි.**
**එම පිළිතුරු යටින් ඉරක් අඳින්න.**

01. පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් සූක්ෂම ආර්ථික විද්‍යාවට අයත් යථානුරූප ප්‍රකාශය කුමක්ද ?
    i. සමස්ත ඉල්ලුම ඉහළ යනවිට මිල මට්ටම ඉහළ යයි.
    ii. වැය කල හැකි ආදායම පහළ යනවිට පෞද්ගලික ඉතුරුම් පහළ යයි.
    iii. රටක සාමාන්‍ය මිල මට්ටම 12% ක් ඉක්මවීම ආර්ථිකමය වශයෙන් අහිතකර වේ.
    iv. සාමාන්‍ය භාණ්ඩයක මිල ඉහළ යනවිට එහි ඉල්ලුම් ප්‍රමාණය පහළ යයි.
    v. සාමාන්‍ය පොලී අනුපාතිකය ඉහළ යනවිට ව්‍යාපාර ආයෝජන පහළ යයි.

02. පහත දැක්වෙන රූප සටහනේ Xy හා XZ යන වක්‍ර මගින් දැක්වෙන්නේ A භාණ්ඩයේ තාක්ෂණික දියුණුවක් ඇතිවීමට පෙර හා ඇතිවූ පසු නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර 2 කි.





තාක්ෂණික දියුණුවෙන් පසු A භාණ්ඩයෙන්.
OQ ඒකක ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමේ දී ආවස්ථික පිරිවැයේ හටගෙන ඇති අඩුවීම B භාණ්ඩයේ ඒකක වලින් පෙන්නුම් කෙරෙනුයේ,

i. MX    ii. OX    iii. YZ    iv. QY    v. MN

03. වෙළෙඳ පොළ ආර්ථිකයකට වඩා සැලසුම් ආර්ථිකයක ඉතා ඉහළින් දැකිය හැක්කේ,
    i. කාර්යක්ෂමතාවයයි.    ii. නම්‍යශීලී භාවයයි.
    iii. නවෝත්පාදන සඳහා යොමු වීමයි.
    iv. ස්ථායිතාවයයි.
    v. ආර්ථික වෘද්ධියයි.

04. පහත සඳහන් දෑ අතුරින් නිෂ්පාදන සාධකයක් වනුයේ, කවරක්ද ?
    i. ආයතන විසින් උපයනු ලබන ලාභය
    ii. ආයතනයට අයත් හෝ කුලියට ලබාගත් ඉඩම්
    iii. ආයතනය සතු බැංකු ගිණුම් වල ඇති මුදල්
    iv. ශ්‍රමයේ ඵලදායිතාවය
    v. ප්‍රචාරණය සඳහා දරණ ලද වියදම්

05. එක්තරා ආර්ථිකයක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය පහත රූප සටහනෙහි දැක්වේ.




නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත A ලක්ෂයේ සිට B ලක්ෂය කරා ගමන් කරන විට ඉන් අදහස් කරනුයේ,

i. ආර්ථිකයේ නිෂ්පාදන කාර්යක්ෂමතාව තව තවත් ඉහළ යන බවයි.
ii. ආර්ථිකයේ සම්පත් වැඩි වැඩියෙන් උපයෝජනයට යොදා ගැනෙන බවයි.
iii. පරිමාණානුකූල පිරිමැසුම් නිසා ආර්ථිකයට ප්‍රතිලාභ සැලසෙන බවයි.
iv. ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය පහළ වැටෙන බවයි.
v. ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය ඉහළ නගින බවයි.

06. පහත සඳහන් දෑ අතුරින් කිසියම් භාණ්ඩයක ඉල්ලුම වැඩිවීමක් ඇති කිරීමට හේතු නොවන සාධකය කුමක්ද ?

i. පාරිභෝගික ආදායමේ ඉහළ යෑමක්
ii. එම භාණ්ඩයේ මිල පහල වැටීමක්
iii. ආදේශන භාණ්ඩයක මිල වැඩිවීමක්
iv. අනුපූරක භාණ්ඩයක මිල අඩුවීමක්
v. එම භාණ්ඩය සඳහා පාරිභෝගික අභිරුචිය වැඩිවීමක්

07. $x$ භාණ්ඩයක අදාළ තොරතුරු පහත දැක්වේ.

| | මිල | ඉල්ලුම් ප්‍රමාණය |
|---|---|---|
| 2010 ජනවාරි | 20 | 5000 |
| 2015 ජනවාරි | 30 | 6000 |

ඉහත ලේඛනයට අදාළ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. මෙම භාණ්ඩයේ මිල වැඩිවන විට ඉල්ලුම් ප්‍රමාණයද වැඩිවේ යැයි නිගමනය වේ.
ii. මෙම භාණ්ඩයේ ඉල්ලුම් වක්‍රය ඉහළට බෑවුම් වේ.
iii. $x$ භාණ්ඩය ගිෆන් භාණ්ඩයකි.
iv. ඉහත දත්ත අනුව $x$ භාණ්ඩයේ ඉල්ලුම් වක්‍රය ඇඳිය නොහැක.
v. ඉල්ලුම තීරණය කරන අන් සාධක ස්ථාවරව පමණි.


08. ඒකීය මිල ඉල්ලුම් නම්‍යතාවයක් සහිත භාණ්ඩයක් එක්තරා නිෂ්පාදන ආයතනයක් විසින් ඒකකයක් රු 20 බැගින් වූ මිලකට ඒකක 4000 ක් අලෙවි කෙරේ. භාණ්ඩය අලෙවි කරනු ලබන මිල රු 5 ක් වුවහොත් කොපමණක ඒකක ප්‍රමාණයක් අලෙවි කර ගැනීමට ආයතනයට හැකිවේද ?

i. 10000 ii. 16000 iii. 20000 iv. 80000 v. 100000

09. කිසියම් භාණ්ඩයක නිෂ්පාදන පිරිවැයේ අඩුවීමක් හට ගන්නා අතර ම එම භාණ්ඩය සඳහා ඉල්ලුමෙහි අඩුවීමක් ද හටගන්නා බව සලකන්න. මෙම වෙනස්කම් වල ඒකාබද්ධ බලපෑම කරන කොටගෙන භාණ්ඩයේ මිල හා සපයනු ලබන ප්‍රමාණය කෙරෙහි කවර බලපෑමක් ඇතිවේද ?

| | මිල | සපයනු ලබන ප්‍රමාණය |
|---|---|---|
| i. | අඩුවේ | අඩුවේ |
| ii. | අඩුවේ | වැඩිවේ |
| iii. | අවිනිශ්චිත වේ | අඩුවේ |
| iv. | අඩුවේ | අවිනිශ්චිත වේ |
| v. | වැඩිවේ | වැඩිවේ |

10. එක්තරා භාණ්ඩයක ඉල්ලුම් වක්‍රය පහත ප්‍රස්ථාරයේ දැක්වෙන අතර. එම ඉල්ලුම් වක්‍රයේ මධ්‍ය ලක්ෂ්‍යය A මගින් දැක්වේ.




ඉහත ඉල්ලුම් වක්‍රය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක්ද ?

i. $P_1$ මිලට පහළ මිල ගණන් යටතේ මිල ඉල්ලුම් නම්‍යතාවය එකට අඩු අගයක් ගන්නා අතර, මිල පහළ යනවිට ව්‍යාපාරික අය භාරය ඉහළ යයි.

ii. $P_1$ මිලට ඉහළ මිල ගණන් යටතේ මිල ඉල්ලුම් නම්‍යතාව එකට වැඩි අගයක් ගන්නා අතර මිල ඉහළ යනවිට ව්‍යාපාරික අය භාරය පහළ යයි.

iii. $P_1$ ට පහළ මිල ගණන් යටතේ මිල ඉල්ලුම් නම්‍යතාව එකට වැඩි අගයක් ගන්නා අතර මිල පහළ යනවිට ව්‍යාපාරික අය භාරය පහළ යයි.

iv. $P_1$ ට ඉහළ මිල ගණන් යටතේ මිල ඉල්ලුම් නම්‍යතාව එකට අඩු අගයක් ගන්නා අතර. මිල පහළ යනවිට ව්‍යාපාරික අය භාරය ඉහළ යයි.

v. $P_1$ ට පහළ මිල ගණන් යටතේ මිල ඉල්ලුම් නම්‍යතාව එකට අඩු අගයක් ගන්නා අතර, මිල ඉහල යනවිට ව්‍යාපාරික අය භාරය පහළ යයි.

11. $Qd = 120 - 8p$ වශයෙන් පාරිභෝගික ඉල්ලුම් වක්‍රයත්, වෙළෙඳ පොළ මිල, $P = 10$ ක් ලෙසත් දී ඇති විටක පාරිභෝගික අතිරික්තය.

i. රු. 15 කි ii. රු. 100 කි iii. රු. 112 කි iv. රු. 120 කි v. රු. 400 කි

12. එක්තරා භාණ්ඩයක ආදායම් ඉල්ලුම් නම්‍යතාව -1.7 ක් වේ නම්, අපට එළඹිය හැකි නිගමනය වනුයේ,

i. ආදායමේ හටගන්නා වැඩිවීමක් එම භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම වැඩිකිරීමට හේතුවන බවය.

ii. එම භාණ්ඩ නිශ්චිත වශයෙන්ම අත්‍යවශ්‍ය භාණ්ඩයක් වන බවය.

iii. එම භාණ්ඩය සාමාන්‍ය භාණ්ඩයක් වන බවය.

iv. එම භාණ්ඩයේ මිල 1% කින් අඩුවීමක් නිසා එම භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම 1.7% කින් වැඩිවන බවය.

v. ආදායමෙහි හටගන්නා අඩුවීමක් එම භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම වැඩි කිරීමට හේතුවන බවය.

13. $x$ යන y භාණ්ඩ අනුපූරක භාණ්ඩ වේ. y භාණ්ඩයේ සැපයුම වැඩිවීමක් නිසා $x$ භාණ්ඩයේ සමතුලිත මිල හා ප්‍රමාණය කෙරෙහි කෙබඳු බලපෑමක් සිදුවේද ?


| | $x$ භාණ්ඩයේ සමතුලිත මිල | $x$ භාණ්ඩයේ සමතුලිත ප්‍රමාණය |
|---|---|---|
| i. | අඩුවේ | අඩුවේ |
| ii. | අඩුවේ | වැඩිවේ |
| iii. | වැඩිවේ | අඩුවේ |
| iv. | වැඩිවේ | වැඩිවේ |
| v. | අඩුවේ | නොවෙනස්ව පවතී |

14. 10% ක මිල අඩුවීමක් නිසා $x$ භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය 12% කින්ද, $y$ භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය 9% කින්ද වැඩිවේ යැයි සිතන්න. $x$ හා $y$ භාණ්ඩ සම්බන්ධයෙන් වඩාත් නිවැරදි සංයෝගය තෝරන්න.

| | මිල ඉල්ලුම් නම්‍යතාවය | පාරිභෝගික පැහැදම |
|---|---|---|
| i. | $x$ භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය 1.2 කි | වැඩිවේ |
| ii. | $x$ භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය 0.9 කි. | වැඩිවේ |
| iii. | $y$ භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය 0.9 කි. | වැඩිවේ |
| iv. | $y$ භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය 1.2 කි. | අඩුවේ |
| v. | $x$ භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය 1.2 ක් වන අතර $y$ භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය 0.9 කි. | භාණ්ඩ දෙකේම පැහැදම වැඩිවේ |

15. ආදේශ ප්‍රතිවිපාකයේ බලපෑමෙන් භාණ්ඩයක ඉල්ලුම් ප්‍රමාණය අඩුවීමට බලපාන කරුණක් වන්නේ,
   i. ආදේශන භාණ්ඩයක මිල පහළ යෑම.
   ii. අනුපූරක භාණ්ඩයක මිල ඉහළ යෑම.
   iii. පාරිභෝගික ඉල්ලුමේ අඩුවීමක්
   iv. පාරිභෝගික ආදායම අඩුවීමක්
   v. භාණ්ඩය මත රජය වක්‍ර බද්දක් පැනවීම.

16. තරඟකාරී වෙළෙඳපොළක අලෙවි කරණ භාණ්ඩයක් සඳහා විකුණුම් කරුවන් මත ඒකක බද්දක් පැනවීමෙන් පසු ප්‍රස්ථාර සටහන පහත දැක්වේ.




බද්දෙන් පසු පහත සඳහන් දෑ නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

| | පරිභෝගික අතිරික්තය | රජයේ මුළු බදු අය භාරය | නිෂ්පාදකයින්ට ලැබෙන ශුද්ධ මිල | බද්දේ ශුද්ධ සමාජ ශුභ සාධන පාඩුව | සැපයුම් වක්‍රයේ නම්‍යතාවය |
|---|---|---|---|---|---|
| i. | A | B+C | $P- P_2$ | D | ඒකීය |
| ii. | A+B+ C+D | B+C+E+F | $P_1$ | E | එකට වැඩි |
| iii. | A | B+C+E+F | $P_2$ | D+G | එකට වැඩි |
| iv. | A+B+E | C+D+F+G | $P- P_2$ | C+D | එකට අඩු |
| v. | A+B | D+G | p | E+F+G | පූර්ණ නම්‍ය |

17. තරඟකාරී වෙළෙඳපොලක අලෙවි කරන භාණ්ඩයක වෙළෙඳ පොළ සැපයුම් වක්‍රයට අදාළ සැපයුම් සමීකරණය පහත දැක්වේ.

QS = 30 + 3P

රජය මෙම භාණ්ඩයේ විකුණුම් කරුවන් මත ඒකකයකට රු 10 බැගින්වූ භාණ්ඩ බද්දක් පැනවීමෙන් පසු භාණ්ඩයේ වෙළෙඳපොළ සැපයුම් සමීකරණය,

i. QS = - 30 + 3P
ii. QS = - 3P
iii. QS = 60 + 3P
iv. QS = 3P
v. QS = 30 + 13P

18. ඉහත 17 වන ප්‍රශ්නය යටතේ ඉදිරිපත් කර ඇති සැපයුම් සමීකරණය නැවත සැලකිල්ලට ගන්න. මෙම භාණ්ඩයේ වෙළෙඳපොළ ඉල්ලුම් සමීකරණය

QD = 100 - 2P නම්, රු 10 ක ඒකක බද්දක් පැනවීමෙන් පසු සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය වන්නේ,

| | සමතුලිත මිල | සමතුලිත ප්‍රමාණය |
|---|---|---|
| i. | රු. 14 කි | ඒකක 72 කි |
| ii. | රු. 20 කි | ඒකක 60 කි |
| iii. | රු. 30 කි | ඒකක 60 කි |
| iv. | රු. 12 කි | ඒකක 50 කි |
| v. | රු. 18 කි | ඒකක 80 කි |

19. තරඟකාරී වෙළෙඳ පොළක් හා සම්බන්ධ ප්‍රකාශ 2 ක් පහත දැක්වේ.


"තරඟකාරී වෙළෙඳ පොළක භාණ්ඩයක මිල තීරණය වන්නේ ඉල්ලුම හා සැපයුම මගිනි"

"ඉල්ලුම හා සැපයුම තීරණය වන්නේ මිල මගිනි"

ඉහත ප්‍රකාශ දෙක සම්බන්ධයෙන් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

i. පළමු ප්‍රකාශය පමණක් නිවැරදි වේ.
ii. දෙවන ප්‍රකාශය පමණක් නිවැරදි වේ.
iii. ප්‍රකාශ දෙකම වැරදි වේ.
iv. ප්‍රකාශ දෙකම නිවැරදි වේ.
v. දෙවන ප්‍රකාශය නිවැරදි වන අතර, පළමු ප්‍රකාශය පිළිබඳ නිශ්චිත අදහසක් ප්‍රකාශ කළ නොහැක.

20.




මෙම ප්‍රස්ථාර සටහනේ ඇති ඉල්ලුම් වක්‍රයට අදාළ මිල උක්ත වන ඉල්ලුම් සමීකරණය වන්නේ,

i. Qd = 160 - 2p    ii. Qd = 80 - 0.5p    iii. P = 160- 2Qd
iv. P = 80 - 0.5Qd    v. P = 0.5 - 80 Qd

**ඩී.එස්. සේනානායක විද්‍යාලය, කොළඹ 07.**

**දෙවන වාර පරීක්ෂණය - 2016**
**12 ශ්‍රේණිය**
**ආර්ථික විද්‍යාව - II**

*කාලය පැය 2*

**ඕනෑම ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න**

01. i. "ශ්‍රමය හා ප්‍රාග්ධනය යන නිෂ්පාදන සාධක දෙකෙහිම ලක්ෂණ මානව ප්‍රාග්ධනය තුළ සංකලනය වී පවතී."
   අ. මානව ප්‍රාග්ධනය තුළ අන්තර්ගත ප්‍රාග්ධනයේ ලක්ෂණ කවරේද ? (ලකුණු 02)
   ආ. ශ්‍රමය හා මානව ප්‍රාග්ධනය අතර පවතින වෙනස්කම් කවරේද ? (ලකුණු 02)
   ii. ශ්‍රී ලංකාවේ ප්‍රයෝජනයට නොගත් ශ්‍රම සම්පත් සැහෙන ප්‍රමාණයක් තිබියදී ශ්‍රී ලංකාවේ සම්පත් හිඟයක් ඇතැයි පැවසීම කෙතෙක් දුරට නිවැරදි ද ? (ලකුණු 03)
   iii. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් දකුණට විතැන්වීමට බලපාන සාධකද, එම සාධක වලට අදාළ සිදුවීම් ද දක්වන්න. (ලකුණු 04)
   iv. සූක්ෂම ආර්ථික න්‍යාය සහ සාර්ව ආර්ථික න්‍යාය අතර පවතින සම්බන්ධතාවය පැහැදිලි කරන්න. (ලකුණු 02)
   v. වැඩිවන ආවස්ථික පිරිවැයට බලපාන හේතු කවරේද ? (ලකුණු 02)

02. i. "ආර්ථික විද්‍යාව තුළ ඉල්ලුම යන සංකල්පය සැමවිටම කථා කරන්නේ සඵල ඉල්ලුම යන අර්ථයෙනි." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 03)
   ii. ඉල්ලුම් නිතිය සහ ඉල්ලුම් ශ්‍රිතය අතර වෙනස කුමක්ද ? (ලකුණු 03)
   iii. "භාණ්ඩයක මිල අඩුවන විට ඉල්ලුම් ප්‍රමාණය වැඩිවේ."
   "ඉල්ලුමේ වැඩිවීමක් මිල ඉහළ යෑමකට තුඩුදේ."
   ඉහත ප්‍රකාශ දෙක එකිනෙකට පරස්පර විරෝධී වන්නේද ? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 03)
   iv. මිල වෙනස්වීමක ආදේශන ප්‍රතිවිපාකය හා ආදායම් ප්‍රතිවිපාකය යොදා ගනිමින් සාමාන්‍ය භාණ්ඩ, බාල භාණ්ඩ හා ගිෆන් භාණ්ඩ හඳුනාගත හැකි ආකාරය පෙන්වන්න. (ලකුණු 03)
   v. භාණ්ඩයක් සඳහා වන වෙළෙඳ පොළ ඉල්ලුම් වක්‍රයක් ඇඳීමේදී යොදාගනු ලබන උපකල්පන කවරේද ? එම උපකල්පන වල වෙනස්වීමක් නිසා ඉල්ලුම් ප්‍රමාණය වෙනස්වේද? යන්න පිළිබඳ විමසුමක් කරන්න. (ලකුණු 03)


03. i. $x$ භාණ්ඩයේ මිල රු 5 ක් වනවිට මුළු අය භාරය රු 5000 කි. එම මිලේ මිල ඉල්ලුම් නම්‍යතාවය -4 කි. භාණ්ඩයේ මිල රු 4 ක් දක්වා අඩු කලේ නම් ආයතනයේ මුළු අයභාරය කොපමණ ප්‍රමාණයකින් වෙනස්වේද ? (ලකුණු 03)
   ii. පහත දැක්වෙන එක් එක් ප්‍රකාශයක් මගින් කියවෙනුයේ කවර භාණ්ඩ වර්ගයක්ද යන්න හඳුනා ගන්න.
   අ. $x$ භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය ධන අගයක් ගනී.
   ආ. $y$ භාණ්ඩයේ ආදායම් ඉල්ලුම් නම්‍යතාවය 0.5 කි.
   ඉ. P හා Q යන භාණ්ඩ දෙක අතර, හරස් ඉල්ලුම් නම්‍යතාවය 1.5 කි. (ලකුණු 03)
   iii. භාණ්ඩයක ඉල්ලුම නම්‍යවීමට හෝ අනම්‍යවීමට බලපාන සාධක කවරේද ? (ලකුණු 03)
   iv. ඉල්ලුම් වක්‍රයක බෑවුම සහ මිල ඉල්ලුම් නම්‍යතාවය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 03)
   v. රජයට ලැබෙන බදු අයභාරය වැඩි කරගැනීමේ අදහසින් භාණ්ඩයක් මත පනවන බද්ද වැඩි කිරීමේදී එම භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය පිළිබඳ අවධානය යොමු කළ යුත්තේ ඇයි ? (ලකුණු 03)

04. i. සමතුලි හුවමාරුවේදී හටගන්නා ආර්ථික අතිරික්තය යන සංකල්පය කුමක් අදහස් වේද ? එම සංකල්පයේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 04)


ii. භාණ්ඩයක සැපයුම නම්‍යද ? අනම්‍යද ? යන්න හඳුනාගැනීම සඳහා භාවිතා කල හැකි මිනුම් කවරේද ? (ලකුණු 03)

iii. භාණ්ඩයක සමතුලිත වෙළෙඳපොළ මිල වෙනස් නොවන පරිදි ඉල්ලුම හා සැපයුම වෙනස් විය හැක්කේ කෙසේද ? ප්‍රස්ථාර සටහන් යොදා ගනිමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. 1 වන රූප සටහන




2 වන රූප සටහන




අ. 1 වන රූප සටහනේ ඇති ඉල්ලුම් වක්‍ර දෙකේ P මිලට අදාළ A හා B යන ලක්ෂවල මිල ඉල්ලුම් නම්‍යතාවය පිළිබඳ ඔබට කුමක් කිවහැකිද ? (ලකුණු 02)

ආ. 2 වන රූප සටහනේ ඇති ඉල්ලුම් වක්‍ර දෙකේ P මිලට අදාළ A හා B යන ලක්ෂ්‍ය වල මිල ඉල්ලුම් නම්‍යතාවය පිළිබඳ ඔබට කුමක් කිව හැකිද ? (ලකුණු 02)

05. තරඟකාරී වෙළෙඳ පොළක අලෙවි කෙරෙන භාණ්ඩයක් පිළිබඳ පහත දැක්වෙන තොරතුරු ඔබට සපයා ඇත.

| මිල | ඉල්ලුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණය | අධි ඉල්ලුම් ප්‍රමාණය | අධි සැපයුම ප්‍රමාණය |
|---|---|---|---|---|
| 10 | 500 | - | 400 | - |
| 50 | - | 500 | - | 400 |

i. ප්‍රස්ථාර සටහනක් මත ඉල්ලුම් හා සැපයුම් වක්‍ර ඇඳ සමතුලිත මිල හා ප්‍රමාණය ගණන් බලන්න. (ලකුණු 02)

ii. ඉල්ලුම් වක්‍රය හා සැපයුම් වක්‍රය විස්තර කෙරෙන ඉල්ලුම් සමීකරණය හා සැපයුම් සමීකරණය සකස් කරන්න. (ලකුණු 02)

iii. ඉල්ලුම් සමීකරණය හා සැපයුම් සමීකරණය භාවිතයෙන් සමතුලිත මිල හා ප්‍රමාණය ගණන් බලන්න. (ලකුණු 02)

v. සමතුලිත හුවමාරුවේදී හටගන්නා පාරිභෝගික අතිරික්තය කොපමණද ? (ලකුණු 02)

vi. මෙම භාණ්ඩයේ අධි ඉල්ලුම් වක්‍රය අළුත් ප්‍රස්ථාර සටහනක අඳින්න. එය භාවිතයෙන් සමතුලිත මිල දක්වා එය සමතුලිත මිලක් ලෙස හැඳින්වීමට හේතු දක්වන්න. (ලකුණු 03)

vii. ඉල්ලුම් වක්‍රයේ මිල ඉල්ලුම් නම්‍යතාවය 1 කට සමාන වන්නේ කවර මිලකදී ද ? යන්න සඳහන් කර ගණනය කිරීම මගින් එය ලබාගන්න. (ලකුණු 02)

viii. වෙළෙඳපොලේ භාණ්ඩ ප්‍රමාණය ඒකක 100 ක් නම් අධි ඉල්ලුම් මිල කොපමණද ? (ලකුණු 02)